ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**නව සහනාධාර තොග ශ්‍රී ලංකාවට: සාගර් බන්ධු මෙහෙයුම යටතේ ඉන්දියාව විසින් ලබා දෙන බහුවිධ සහය අඛණ්ඩව**

මෙට්‍රික් ටොන් 50ක තවත් වියළි සලාක තොගයක් රැගත් ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ ශෞර්යා නෞකාව දෙසැම්බර් 15 වන දින ශ්‍රී ලංකාවට ළඟා විය. ආපදාවෙන් බලපෑමට ලක්වූ ජනතාවට ලබාදෙන සහය තවත් ශක්තිමත් කරමින් මෙම සහනාධාර තොගය නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මැතිතුමා විසින් වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ජනිත රුවන් කොඩිතුවක්කු මැතිතුමා වෙත භාර දෙන ලදී.

2. දෙසැම්බර් 14 වන දින ඉන්දීය ගුවන් හමුදාවේ C–17 ග්ලෝබ්මාස්ටර් ගුවන් යානයක් ඖෂධ ටොන් 10ක් සහ වියළි සලාක ටොන් 15ක් රැගෙන ශ්‍රී ලංකාවට පැමිණි අතර මහියංගනයේ ස්ථාපනය කර තිබූ ඉන්දීය යුධ හමුදා ක්ෂේත්‍ර රෝහල් කණ්ඩායම සිය මානුෂීය මෙහෙයුම සාර්ථකව අවසන් කර එම ගුවන් යානයෙන් ඉන්දියාව බලා පිටත් විය.

3. අත්‍යාවශ්‍ය මාර්ග සම්බන්ධතා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වන ප්‍රයත්නයන් ක්‍රියාත්මක වෙමින් පවතින අතර හලාවත සහ කිලිනොච්චියේ පාලම් ඉදි කිරීම සඳහා මූලික කටයුතු සිදු වෙමින් පවතී. හානියට පත් වූ කිලිනොච්චි පාලම සම්පූර්ණයෙන් ඉවත් කෙරෙමින් පවතින අතර ප්‍රදේශයේ ගමනාගමන පහසුකම් යථාවත් කරමින් බේලි පාලමක් ඉදි කිරීමට කටයුතු සූදානම් වෙමින් තිබේ.

4. වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු අනුර කරුණාතිලක මැතිතුමා සහ නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මැතිතුමා ඉදිරියේදී, කොළම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (CWIT) විසින් "Rebuilding Sri Lanka" අරමුදල වෙත ශ්‍රී ලංකා රුපියල් මිලියන 100ක් පරිත්‍යාග කරන ලදී. CWIT සමාගම අදානි පෝර්ට්ස්, ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර ඒකාබද්ධ ව්‍යාපාරයකි.

5. මේ අතර ඉන්දීය සංස්කෘතික සංගමය (ICA) විසින් ජනශක්ති ලයිෆ් - ICA ජාත්‍යන්තර අර්ධ මැරතන් ධාවන තරඟය රටවල් 39ක තරඟකරුවන් 2,500කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් දෙසැම්බර් 14 වන දින කොළඹ දී පවත්වන ලදී. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අමාත්‍යාංශයේ සහයෝගය මත පැවති මෙම ධාවන තරඟය මගින් මලල ක්‍රීඩාවේ විශිෂ්ටත්වය සහ සමාජ බලපෑම සැමරූ අතර පිරිමි කාණ්ඩයේ ජයග්‍රාහකයා වූ කිත්සංග ඉසිබවේ මූසස් තම ජයග්‍රහණය වෙනුවෙන් හිමි වූ රුපියල් මිලියනයක මුදල ICA ළමා නිවාස ජල පිරිපහදුකරණ ව්‍යාපෘතිය සඳහා පරිත්‍යාග කළේය. මෙම වසරේ ධාවන තරඟය ජාත්‍යන්තර

සහෝදරත්වය ඉහළ නංවමින් ශ්‍රී ලංකාව පුරා ප්‍රජාවන්ට ඉතා වටිනා ප්‍රතිලාභ ලබා දීමට සමත් විය.

6. ඉන්දීය ගුවන් හමුදාවේ අවසන් MI -17 හෙලිකොප්ටරය ද සාගර් බන්ධු මෙහෙයුම යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ සමීප සම්බන්ධීකරණයෙන් සහන කටයුතු සඳහා සහයෝගය ලබා දී සිය මෙහෙයුම අවසන් කර දෙසැම්බර් 14 වන දින දිවයිනෙන් පිටත්ව ගියේය. 2025 දෙසැම්බර් 29 වන දින සිට ඉන්දීය ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා තුනක් ද ඉන්දීය නාවික හමුදාවේ හෙලිකොප්ටර් යානා දෙකක් ද අවැසි මොහොතේ ශ්‍රී ලංකාව හා ශක්තිමත්ව රැඳී සිටිමින් මෙහෙයුම සඳහා සහභාගී විය. මෙම හෙලිකොප්ටර් යානා විසින් පුද්ගලයන් 272 දෙනෙකු මුදවා ගන්නා ලද අතර ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් මෙන්ම සහනාධාර ටොන් 61කට අධික ප්‍රමාණයක් ගුවනින් රැගෙන යන ලදී.

7. සාරාංශය: සාගර් බන්ධු මෙහෙයුම (2025 දෙසැම්බර් 17 වන දින දක්වා)

2025 නොවැම්බර් 28 වන දින සාගර් බන්ධු මෙහෙයුම ඇරඹි මොහොතේ සිට මේ දක්වා ඉන්දියාව විසින් වියළි සලාක, කූඩාරම්, ඉටිරෙදි, සනීපාරක්ෂක කට්ටල, ඇඳුම්, ජල පිරිපහදුකරණ කට්ටල ඇතුළු මානුෂීය සහන ටොන් 1,134කට අධික ප්‍රමාණයක් ද ඖෂධ සහ ශල්‍ය උපකරණ ටොන් 14.5ක් ද ලබා දී ඇත. මෙයට අමතරව විශේෂ උපකරණ ටොන් 60ක් ද ලබා දී ඇත. ඉන්දීය නාවික හමුදාවේ INS වික්‍රාන්ත්, INS උදේගිරි, INS සුකන්‍යා, LCU 54, LCU 57, LCU 51 සහ INS ඝරියාල් නෞකාවන් මෙන්ම ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ ශෞර්යා නෞකාව විසින් විශාල සහනාධාර තොග කොළඹට සහ ත්‍රිකුණාමලයට රැගෙන එන ලදී. ජාතික ආපදා ප්‍රතිචාර බලකායේ කණ්ඩායම් දෙකක් (K9 ඒකක සහිතව 80කින් සමන්විත කාර්ය මණ්ඩලය) විසින් හදිසි සෙවීමේ සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සිදු කරන ලදී. මේ අතර සාමාජිකයන් 85 දෙනෙකුගෙන් යුත් ඉන්දීය යුධ හමුදා ක්ෂේත්‍ර රෝහලක් ද මහියංගනයේ ස්ථාපනය කරන ලද අතර ඒ මගින් පුද්ගලයන් 7,000 දෙනෙකුට ජීවිත සුරැකීමේ වෛද්‍ය පහසුකම් ලබා දෙන ලදී. BHISHM ආරෝග්‍ය මෛත්‍රී කියුබ් භාවිතා කරමින් වෛද්‍ය මධ්‍යස්ථාන දැඩි ලෙස බලපෑමට ලක් වූ ප්‍රදේශවල පිහිටුවන ලදී. ටොන් 248ක බේලි පාලම් කොටස් සහ ඉංජිනේරුවන් 48 දෙනෙකු අත්‍යාවශ්‍ය මාර්ග සම්බන්ධතා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ගුවනින් රැගෙන එන ලදී. ඉන්දීය ගුවන් හමුදාවේ සහ නාවික හමුදාවේ හෙලිකොප්ටර් යානා 5ක් අර්බුදකාරී සමයක දී ශ්‍රී ලංකාවට ඉන්දියාවේ නොසැලෙන කැපවීම පිළිබිඹු කරමින් පීඩාවට පත් ජනතාව ආපදාවට ලක් වූ ප්‍රදේශයන්ගෙන් ඉවත් කරන ලදී; හමුදා සාමාජිකයන් ගුවනින් ගෙන යන ලදී; සහනාධාර භාර දෙන ලදී.

***

**කොළඹ**

***2025*** *දෙසැම්බර්* ***17***